# 3. දේව නිර්මාණයේ මුදුන් මල්කඩ-මිනිසා




මේ ලෝකය ඉතා මනහර ලෙස දෙවියන් වහන්සේ මැවූ බවට, ඔබ පසු ගිය පාඩම් දෙකෙන් මේ වන විටත් දැනුවත් ව සිටී. ඉහළ අහස, පහත පොළොව, ආකාශ මණ්ඩලය, විවිධ ගස්වැල්, රසැති පළතුරු, සුවඳැති මල් වර්ග සහිත මේ ලෝකය දෙවියන් වහන්සේ අපට දුන් තිළිණ වේ. මේ මනහර ලෝකය ඔපවත් කරමින් ඇදහැලෙන දිය ඇලි, ගංගා, කරදිය ජලයෙන් පිරුණ මහා සයුරත් දියෙහි රඟන මසුන් හා ලොව පුරා ව්‍යාප්ත ව සිටින විවිධ සත්ත්ව වර්ගයා ගැනත් මෙනෙහි කරන කල මැවුම්කරුවාණන්ගේ උතුම්කම ඉතා හොඳින් පැහැදිලි වේ.

ශුද්ධ වූ බයිබලයට අනුව මැවිල්ලේ උතුම් ම ස්ථානය හිමිකර ගන්නේ මිනිසා ය. එයින් අදහස් වන්නේ අප සියල්ලන්ගේ ම මැවුම්කරුවාණන් දෙවියන් වහන්සේ බවත් ඔබ සහ මම උන්වහන්සේ ඉදිරියේ ඉතා වටිනා අය බවත් ය. ශුද්ධ බයිබලයේ දෙවියන් වහන්සේ අප ව මැවූ බව මෙසේ ලියා තිබේ.

**දෙවියන් වහන්සේ තම ස්වරූපය අනුව මිනිසා මැවූ සේක.**
**දෙවියන් වහන්සේගේ ම ස්වරූපය අනුව ඔවුන් මවා වදාළ සේක.**
**පුරුෂයා ද ස්ත්‍රිය ද කොට ඔවුන් මවා වදාළ සේක.**

**උත්පත්ති 1 : 27-28**

එසේම දෙවියන් වහන්සේ තම ස්වරූපය අනුව පුරුෂයා හා ස්ත්‍රිය මවා තිබෙන නිසා මිනිසා මැවිල්ලේ ඉතා වටිනා ස්ථානයක් හිමි කර ගනී යි. එසේ ඔවුන් ව දෙවියන් වහන්සේ මවා තිබෙන නිසා, පුරුෂයා සහ ස්ත්‍රිය එක සමාන වටිනාකමකින් යුක්ත ය. දෙවියන් වහන්සේ තම ස්වරූපයෙන්

මිනිසා මවා වදාළ හෙයින් උන්වහන්සේට ප්‍රසන්න වන වටිනාකම් තුළ යහපත් ලෙස ජීවත් වීම අපේක්ෂිත ය.

### දරුවන් ලෙස දෙවියන් වහන්සේට ප්‍රසන්න වටිනාකම් හඳුනා ගනිමු, වර්ධනය කරමු, ආරක්ෂා කරමු.




මෙම ගුණාංග ඔබගේ ජීවිතය තුළ කොතෙක් දුරට පවතිනවා දැ යි සිතා බලන්න. මෙම සමහර ගුණාංග වැඩි වශයෙන් ඔබ තුළ පවතින බව විශ්වාස ය. මෙම සියලු ම ගුණාංග යහපත් දරුවකු ලෙස මෙලොව ජීවත් වූ ජේසුස් වහන්සේ සතු විය. ජේසුස් වහන්සේ කිතුනු දරුවන්ගෙන් බලාපොරොත්තු වන්නේ ද මෙම යහපත් ගුණාංග හැකි තරම් අපගේ ජීවිතවල වර්ධනය කර ගැනීම ය.

ඔබගේ නිවසේ දී ද පාසලේ දී ද අසල්වාසීන් සමග ජීවත් වන කල හිතමිතුරන් සමග කාලය ගතකරන විට ද ආදරය, කරුණාව, ඉවසීම, බෙදා ගැනීම, එකමුතුකම හා කමාව යන උසස් ගුණාංග වර්ධනය කර ගැනීමට උත්සාහ කරන්න. ඒ සඳහා ජේසුස් වහන්සේගේ පිහිට පතන්න.

මේ ලෝකය නිර්මාණය කිරීමේ දී ඔබගේ ජීවිතය ලබා දුන්නේ දෙවියන් වහන්සේ ය. කිතුනු දරුවන් වන ඔබගෙන් උන්වහන්සේ යම් සුවිශේෂී මෙහෙවරක් ඉටු කරනු ඇතැයි අපේක්ෂිත ය. ඒ සඳහා ජේසුස් වහන්සේ තුළ රැඳෙමින් ඔබගේ ජීවිතය උන්වහන්සේ තුළ වැඩි වර්ධනය කර ගැනීමට උත්සාහ ගත යුතු වේ.

## ක්‍රියාත්මක වෙමු

- සැම කෙනකු ම ආදරයෙන් රැක බලා ගනිමු.
- සෑම ළමයකු ට ම සහෝදරත්වයෙන් සළකමු.
- අපට හැකි අයුරින් දේව මැවිල්ල සුරකිමු.
- දේව මැවිල්ලේ දායාදයන් අරපිරිමැස්මෙන් භුක්ති විඳිමු.
- දේව මැවිල්ලේ උරුමය අනාගත පරපුරට දායාද කරමු.
- විශ්වයේ මැවුම්කාර දෙවිඳුන්ගේ මහිමය හා ශ්‍රේෂ්ඨත්වය අත්දකිමු.
- මැවිල්ල ගැන තුති පුදමු.
- දෙවියන් වහන්සේ ට අපව වටිනවා සේ ම අන් අය ව ද වටිනා බව සිතට ගනිමු.

**ඒදන් උයන රැකබලා ගන්නා පිණිස දෙවියන් වහන්සේ මිනිසා රැගෙන එහි පදිංචි කළ සේක.**
**උත්පත්ති 2:15**

දෙවියන් වහන්සේ "ඒදන් උයන" නිර්මාණය කර මිනිසාට (ස්ත්‍රිය හා පුරුෂයා) ප්‍රීතියෙන් ජීවත් වීමට අවශ්‍යය පරිසරය සකස් කර එහි පදිංචි කළ සේක.

ඒ සමග ම ඔවුන්ට වගකීමක් ද භාර දුන් බව උත්පත්ති 2:15 පදය තුළින් පෙන්වා දෙයි. එම වගකීම වන්නේ, "උයන රැක බලා ගැනීම" යි. එම වගකීම මෙලොව තුළ ජීවත් වන අප සැමට ම අදාළ ය. අද ලෝකය තුළ පරිසරය විනාශ වෙමින් පවතින බව පෙනී යයි. අපට දෙවියන් වහන්සේ බාර දුන් ලෝකය සුරක්ෂිත කර ගනිමින් වගකීමෙන් යුතු ව කටයුතු කිරීම අපේක්ෂා කෙරේ. දරුවන් හැටියට එම වගකීම ඉටු කරන්නට අපි උත්සුක විය යුතු වෙමු.

**කටපාඩම් කරමු.**
**උත්පත්ති 1:27**

ක්‍රියාකාරකම:

1. පරිසරය විනාශ වන ආකාර පහක් සඳහන් කරන්න.
2. ඒ එක් එක් ව්‍යසනය වලක්වා ගැනීමට කළ හැකි පිළියම් යෝජනා කරන්න.